# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/19 - 2010 ජුනි 16 වැනි බදාදා - 2010.06.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජ. කා. අංකය ; සීඒ/3/3/24.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

1. ජනාධිපති නීතිඥ චිත්ත රන්ජන් ද සිල්වා මැතිතුමා
2. ජනාධිපති නීතිඥ ආචාර්ය අම්රිත් රොහාන් පෙරේරා මැතිතුමා
3. මහාචාර්ය මොහොමඩ් තාහීර් මොහොමඩ් ජිෆ්රි මැතිතුමා
4. මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මැතිතුමා
5. චන්දිරපාල් චන්මුගම් මැතිතුමා
6. හේවා මාතර ගමගේ සිරිපාල පලිහක්කාර මැතිතුමා
7. මනෝහරි රාමනාදන් මැතිනිය
8. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා

වෙත,

ශුභාශිංසන පෙරටුවයි !

සමස්ථයක් වශයෙන් මෙරට මුහුණ පා සිටි ගැටුම්කාරී අවධිය සහ අත්විඳි දුක්දොම්නස් පිළිබඳව ප්‍රත්‍යාවේක්ෂණය කිරීමට නිසි අවස්ථාවක් එළඹ ඇතැයි මා අදහස් කරන හෙයින් සහ සියල්ලන්ගේම පොදු අභිලාෂයන් කෙරෙහි සැලකිලිමත්ව අපේ ජනතාවට සාමයෙන්, සාමකාමී පැවැත්මෙන් යුත් සමෘද්ධිමත් යුගයක් නිසැකයෙන්ම උදාකරදීමට අප සාමූහිකව අදිටන් කරගෙන ඇති හෙයින් ද,

බහුවාර්ගික සංවිධිත සමාජයකින් හෙබි ස්වාධීන හා අභිමානවත් ජාතියක් වශයෙන් අප සහයෝගීව, හවුල්ව හා මිත්‍රශීලීව පොදු අරමුණු කරා යන ගමනක් අරඹා ඇති අතර අන්‍යෝන්‍යව සටන් වදින කිසිදු ගැටුම්කාරී තත්ත්වයක් ඉදිරියේදී යළි ඇති නොවන බවට සහතික කෙරෙන පාඩම්, මෑත ඉතිහාසයෙන් අප උගත යුතුව ඇති හෙයින් ද,

1A - G 12997 — 345 (2010/06)

මෙහි මින්මතු සඳහන් කරනු ලබන කාර්යයන් සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කරලීම මහජන ශුභසිද්ධියට හේතු කාරක වන බැව් මා අදහස් කරන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය, ස්වාධීනතාව සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වැනි අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (2) වැනි වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ඉහතකී :

1. ජනාධිපති නීතිඥ චිත්ත රන්ජන් ද සිල්වා මැතිතුමා
2. ජනාධිපති නීතිඥ ආචාර්ය අම්රිත් රොහාන් පෙරේරා මැතිතුමා
3. මහාචාර්ය මොහොමඩ් තාහීර් මොහොමඩ් ජිෆ්රි මැතිතුමා
4. මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මැතිතුමා
5. චන්දිරපාල් චන්මුගම් මැතිතුමා
6. හේවා මාතර ගමගේ සිරිපාල පලිහක්කාර මැතිතුමා
7. මනෝහරි රාමනාදන් මැතිනිය
8. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා

වන ඔබතුමන්ලා, 2002 ක්වූ පෙබරවාරි මස 21 වැනි දින සිට 2009 ක්වූ මැයි මස 19 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී සිදුවිය හැකිව තිබූ මතු දැක්වෙන කරුණු පිළිබඳව පරීක්ෂා කොට, වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙමගින් පත් කරමි.

1. වර්ෂ 2002 ක්වූ පෙබරවාරි මස 21 වැනි දින ක්‍රියාත්මක කෙරුණු සටන් විරාම ගිවිසුම අසාර්ථකවීමට තුඩුදුන් කරුණු හා අවස්ථානුගත තත්ත්වයන් සහ ඉනික්බිතිව 2009 ක්වූ මැයි මස 19 වැනි දින තෙක් අනුපිළිවෙළින් වූ සිද්ධීන්.

2. කිසියම් තැනැත්තෙක්, කණ්ඩායමක් හෝ යම් ආයතනයක් සෘජුව හෝ අනියමින් මේ සම්බන්ධයෙන් වගකීම දරනුයේ ද යන වග.

3. මෙබඳු සිද්ධීන් යළි ඇති නොවන බවට සහතික කරගනු පිණිස එකී සිද්ධීන්ගෙන් අප උගත යුතු පාඩම් සහ අපගේ සැලකිල්ල යොමු විය යුතු තදාශ්‍රිත කරුණු.

4. මෙකී සිද්ධීන්ගෙන් පීඩාවට පත් කිසියම් තැනැත්තෙකුට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට හෝ උරුමක්කාරයන්ට ප්‍රතිසංස්ථාපනයක් කරනු ලැබිය හැකි ක්‍රමවේදය.

5. මෙබඳු කිසියම් සිද්ධීන් ඉදිරි කාලයේදී යළි ඇතිවීම වළක්වාලනු පිණිසත් සියලු ප්‍රජාවන් අතර තවදුරටත් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරලනු පිණිසත් ගනු ලැබිය යුතු ආයතනික, පරිපාලනමය සහ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග සහ මේ අධිකාරි පත්‍රයෙහි නියමයන් යටතේ පරීක්ෂණයට භාජනය කරනු ලැබූ කරුණු වලින් කිසියම් කරුණකට අදාළ එබඳු යම් වෙනත් නිර්දේශයන් කිරීම.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහතකී ජනාධිපති නීතිඥ සහ විශ්‍රාමලත් නීතිපති චිත්ත රන්ජන් ද සිල්වා මැතිතුමන් වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පෙරකී කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යැයි ඔබට පෙනී යන එබඳු සියලු පරීක්ෂණ පැවැත්වීමට හා එබඳු සියලු විමර්ශනයන් කිරීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබට මා මෙයින් අධිකාරය හා බලය පවරන අතර, මේ අධිකාරි පත්‍රයෙහි දින සිට මාස හයක් ඇතුළත ඔබේ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබේ නිර්දේශයන් ඇතුළත් වාර්තාවක් ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණාවලට අදාළ වන කිසියම් පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම් එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ පරීක්ෂණයන්හි හෝ විමර්ශනයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත් කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, (393 වන අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධානයන් මෙම පරීක්ෂණ කොමිෂන් සභාවට අදාළ විය යුතු යයි මම මෙයින් ප්‍රකාශයට පත් කරමි.

වර්ෂ දෙදහස් දහයක් වූ මැයි මස පහළොස් වැනි දින වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

07 — 98

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.